# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මානව සම්පත් දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.11.21 |


## මුදල් මණ්ඩලය නව සහකාර අධිපතිවරු සිව්දෙනෙකු පත් කරයි

මුදල් මණ්ඩලය විසින් 2021 නොවැම්බර් 17 වන දින පැවති රැස්වීමේ දී කේ. ජී. පී. සිරිකුමාර මහතා, ඩී. කුමාරතුංග මහතා, යූ. එල්. මුතුගල මහත්මිය සහ සී. පී. එස්. බණ්ඩාර මහතා 2021 නොවැම්බර් 17 වන දින සිට සහකාර අධිපති ධුරයට උසස් කරන ලදී.

### කේ. ජී. පී. සිරිකුමාර මහතා



ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 21 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සිරිකුමාර මහතා, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ සහ ලේකම් දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු දරමින් සේවය කර ඇත.

ඔහු ජාතික ගෙවීම් කවුන්සිලයේ, මූල්‍ය ස්ථායිතා කමිටුවේ, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුවේ සහ 2006 අංක 30 දරන ගෙවීම් උපාංග වංචා පනත යටතේ පත් කරන ලද විද්වත් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. තව ද, ඔහු මුදල් මණ්ඩලයේ උපදේශක විගණන කමිටුවේ සහ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස ද කටයුතු කර ඇත.

බැංකු හා මූල්‍ය අංශය, මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී මූල්‍යකරණයට එරෙහි නීති ප්‍රතිසංස්කරණ රැසක් හඳුන්වාදීමෙහිලා පුරෝගාමී මෙහෙවරක් සිදුකර ඇති සිරිකුමාර මහතා, මූල්‍ය අංශය ශක්තිමත් කිරීම සඳහා නිරාකරණය කිරීමේ සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග මෙන් ම, බැංකුව තුළ දැඩි යහ පාලන සම්මතයන් හඳුන්වා දීමට මූලිකත්වය ගෙන කටයුතු කර ඇත.

සිරිකුමාර මහතා ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයෙන් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධි ලබා ඇති අතර ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී

(LL.B.) උපාධියක් ද ලබා ඇත. නීතිඥයෙකු වන ඒ මහතා එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අනුකූලතා සංගමයේ (International Compliance Association) සාමාජිකත්වය දරන අතර මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ අනුකූලතා පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමා ලබා ඇත.

## ඩී. කුමාරතුංග මහතා



කුමාරතුංග මහතා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වසර 30කට අධික කාලයක් සේවය කර ඇති අතර 2016 වසරේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කිරීමට පෙර ආර්ථික පර්යේෂණ, බැංකු අධ්‍යයන කේන්ද්‍රය, තොරතුරු තාක්ෂණ සහ කළමණාකාරීත්ව විගණන යන දෙපාර්තමේන්තුවල විවිධ තනතුරු දරමින් සේවය කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් කුමාරතුංග මහතා සීමාසහිත ලංකා මූල්‍ය සේවා කාර්යාංශයෙහි (LFSBL) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ පාලක සභාවෙහි කටයුතු කරනු ලබන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධ්‍යයන සභාවෙහි හා විෂයමාලා සමාලෝචන මණ්ඩලයෙහි සාමාජිකයෙකු වේ. ඔහු ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගමනාගමන කාඩ්පත් භාවිතය අධීක්ෂණය සඳහා පත් කරන ලද මෙහෙයුම් කමිටුව, ශ්‍රමික ප්‍රේෂණ පිළිබඳ කාර්ය සාධක බලකාය, ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් පත් කරන ලද තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බැහැර පැවරීමේ ආංශීය කාර්ය සාධක බලකාය, ඩිජිටල් වේදිකා ප්‍රතිපත්ති රාමුව පිළිබඳ මෙහෙයුම් කමිටුව, ශ්‍රී ලංකා ICTA නියෝජිතායතනය මගින් ඒකීය ඩිජිටල් ව්‍යාපාර පසුතල සැකසීම සඳහා ඉදිරි දැක්ම හා ක්‍රියා සැලසුම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයෙහි උපදේශන කමිටුව සඳහා ද සේවය ලබා දෙයි.

තව ද ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර කමිටු වන ජාතික ගෙවීම් කවුන්සිලයෙහි ලේකම් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ FinTech නියාමන Sandbox හි මූල්‍ය තාක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා වූ කමිටුව, නව තත් කාලීන දළ පියවීම් පද්ධතියක් මිල දී ගැනීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ මෙහෙයුම් කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව, විදේශ සංචිත කළමනාකරණය සඳහා නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් මිල දී ගැනීම සඳහා වූ මෙහෙයුම් කමිටුව, බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) පදනම් කරගත් ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ හවුල් යාන්ත්‍රණය (Shared Know-Your-Customer) සඳහා සංකල්ප සාධනය (Proof of Concept) පිළිබඳ ව්‍යාපෘතියෙහි තේරීම් කමිටුව හා පාලක

කමිටුව සහ කොරියානු බැංකුව සමඟ වන දැනුම හුවමාරු කර ගැනීමේ ගෙවීම් පියවීම් පිළිබඳ වැඩසටහනෙහි කණ්ඩායම් නායක ලෙස ද කටයුතු කළේය.

කුමාරතුංග මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය ද එක්සත් රාජධානියේ එසෙක්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය ද ලබා ඇත. තව ද ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

### යූ. එල්. මුතුගල මහත්මිය



මුතුගල මහත්මිය මහ බැංකුවේ ලේකම්, මූල්‍ය, බැංකු අධීක්ෂණ, රාජ්‍ය ණය, ජාත්‍යන්තර මෙහෙයුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය පද්ධති ස්ථායිතා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල විවිධ තනතුරු දරමින් වසර 30 කට වැඩි කාලයක් සේවය කර ඇත. ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී මෙන් ම ලේකම් ලෙස ද කටයුතු කර ඇත. එමෙන් ම, ඇයට මහ බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රයන් වන මූල්‍ය පද්ධති ස්ථායිතාවය, මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය, ණය හා ආයෝජන කළඹ කළමනාකරණය හා ජාත්‍යන්තර මූල්‍ය සහ විදේශ සංචිත කළමනාකරණය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇත.

තව ද, මුතුගල මහත්මිය විදේශ සංචිත කළමනාකරණ කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, අභ්‍යන්තර ආයෝජන කමිටුව, ශ්‍රී ලංකා රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමේ කමිටුව, කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පිහිටවනු ලැබූ හදිසි ක්‍රියාකාරී කාර්යසාධන බලකාය ඇතුළු විවිධ කමිටුවල සාමාජිකාවක් වශයෙන් ද මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව, විගණන කමිටුව සහ අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුව වැනි කමිටුවල නිරීක්ෂකයෙක් වශයෙන් ද කටයුතු කර ඇත.

එසේම, ඇය සුනාමියෙන් විපතට පත් දරුවන් සඳහා වන මහ බැංකුවේ භාර අරමුදල ඇතුළු සේවක සංගම් විසින් ක්‍රියාත්මක කරන ලද සමාජ වගකීම් සහයෝගීතා ව්‍යාපෘති වෙනුවෙන් ක්‍රියාකාරී ලෙස දායක වී ඇත.

ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිධාරිනියක් වන අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත

සාමාජිකාවක් ද වේ. එසේම, ඇය මූල්‍ය වෙළඳපළ සංගමයේ ACI ගනුදෙනු සහතිකය ලබා ඇත.

### සී. පී. එස්. බණ්ඩාර මහතා



ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 24කට වැඩි පළපුරුද්දක් ඇති සී. පී. එස්. බණ්ඩාර මහතා මූල්‍ය පද්ධති ස්ථායිතාව, ආර්ථික සහ මිල ස්ථායිතාව, ආයතනික සේවා, නියෝජිත කාර්යයන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය, ආයතනික (enterprise-wide) අවදානම් කළමනාකරණය සහ උපාය මාර්ගික සැලසුම් යන ක්ෂේත්‍රවල කටයුතු කර ඇත. ඔහු අවදානම් කළමනාකරණ, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ, ගෙවීම් සහ පියවීම්, රාජ්‍ය ණය සහ තොරතුරු තාක්ෂණ යන දෙපාර්තමේන්තු වල සේවය කර ඇත.

ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් කමිටුවේ ලේකම් ලෙස, ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන කාර්ය සාධක කමිටුවේ සාමාජිකයකු ලෙස, ගෙවීම් ප්‍රතිසංස්කරණ කාර්ය සාධක කමිටුවේ ලේකම් ලෙස, මුදල් මණ්ඩලයේ අවදානම් අධීක්ෂණ කමිටුවේ සහකාර ලේකම් ලෙස, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙස, සහ සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති බණ්ඩාර මහතා මුදල් මණ්ඩලයේ උපදේශන විගණන කමිටුව, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කමිටුව, ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව, අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුව සහ මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවල නිරීක්ෂකයෙකු ලෙස ද කටයුතු කර ඇත. එමෙන් ම ඒ මහතා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටු රැසක සාමාජිකත්වය දරමින්, ජාතික මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුළින් රටේ මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් සපයා ඇත.

බණ්ඩාර මහතා ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් අතර ප්‍රථම මාර්ගගත සන්නිවේදන ජාලය ස්ථාපිත කිරීමටත්, සීමාසහිත ලංකා මූල්‍ය සේවා කාර්යාංශය පිහිටුවීමටත් මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. එමෙන් ම ඔහු විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙන්දේසිය සඳහා ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතිය, විවට වෙළෙඳපොළ මෙහෙයුම් සඳහාවන පියවීම් පද්ධතිය සහ ශ්‍රී ලංකා

මහ බැංකුවේ මාර්ගගත මූල්‍ය වෙළෙඳපොළ අධීක්ෂණ සහ නියාමන වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර සංවර්ධනය කරන ලදී. තව ද, ඒ මහතා ජාතික ගෙවීම් සහ සුරැකුම්පත් පියවීම් පද්ධති යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ දී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය.

ඔහු ජාතික නිෂ්කාශනාගාරයේ (Clearing House) අධ්‍යක්ෂ මණ්ඩලයේ, මානව සම්පත් කමිටුවේ හා විගණන කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහ ලංකාක්ලියර් පෞද්ගලික සමාගමේ විවිධ තාක්ෂණික හා මෙහෙයුම් කමිටු කිහිපයක සභාපති හා සාමාජිකයෙකු ලෙස ක්‍රියා කර ඇත. එමෙන් ම, බණ්ඩාර මහතා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද පත්ව සිටි අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ප්‍රධාන පරීක්ෂකවරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

ඕස්ට්‍රේලියාවේ චාර්ල්ස් ස්ටර්ට් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී උපාධියක් ද, මහ බැංකුකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇති ඔහු, ශ්‍රී ලංකා පරිගණක සංගමයේ සාමාජිකයෙකි.